# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1994 අංක 4 දරන
# ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1994 පෙබරවාරි මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1994 මාර්තු මස 04 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය.

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : 1.00 යි.

**1994 අංක 4 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1994 පෙබරවාරි මස 28 වන දින]

එල්. ඩී.—ඕ. 14/93

**1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—**

**1.** මේ පනත 1994 අංක 4 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**ලුහුඬු නාමය.**

**2.** මෙහි මින් මතු " ප්‍රධාන ප්‍රඥප්තිය " යනුවෙන් සඳහන් කරනු ලබන, 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනතේ 42 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

**1985 අංක 21 දරන පනතේ 42 වන වගන්තිය සංශෝධනය කිරීම.**

" (ඈ) බලපත්‍රලාභියා විසින් පවත්වා ගෙන යනු ලබන විදේශ සේවා නියුක්ති නියෝජ්‍යායතනයේ ව්‍යාපාර කටයුතු සම්බන්ධනයෙන් කාර්යාංශයට අවශ්‍ය වන යම් ලේඛන. ".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

**ප්‍රධාන ප්‍රඥප්තියෙ 44 වන වගන්තිය සංශෝධනය කිරීම.**

' (5) මේ වගන්තියේ කාර්ය සඳහා, " බලපත්‍රලාභියා " යන්නට, මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තා වූ යම් තැනැත්තකුට විරුද්ධව මේ වගන්තිය යටතේ පැමිණිල්ලක් කරන ලද හෝ පරීක්ෂණයක් පවත්වනු ලබන හෝ නඩුවක් පවරන ලද හෝ නඩුවක් පවත්වා ගෙන යනු ලබන හෝ දිනයේ දී, ඒ බලපත්‍රය බලාත්මකව තිබුණේ වුව ද නොතිබුණේ වුවද එවැනි තැනැත්තෙක් ඇතුළත් වේ. '.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

**ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (1) ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සඳහා බඳවාගනු ලබන සෑම තැනැත්තකු විසින් ම, එම සේවා නියුක්තිය අයත් වන ගණය සඳහා, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් මුදලක් කාර්යාංශයට ගෙවනු ලැබිය යුතු ය. එකිනෙකට වෙනස් සේවා නියුක්ති ගණවලට අවශ්‍ය නිපුණත්වය හා වෙනත් අවස්ථාගත කරුණු සැලකිල්ලට ගෙන, ඒ ඒ සේවා නියුක්ති ගණ සම්බන්ධයෙන් වෙනස් මුදල් ප්‍රමාණයන් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ය. ".

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(4) බලපත්‍රලාභියකු විසින් යම් තැනැත්තකු සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සලසනු ලැබූ හෝ ලබා දී ඇති අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ ඒ තැනැත්තා විසින් කාර්යාංශය වෙත ගෙවන ලද මුදලින්—

(අ) සියයට හැත්තෑවකට සමාන මුදලක් ඒ බලපත්‍රලාභියාට ; සහ

(ආ) සියයට දහයකට සමාන මුදලක් 45 වන වගන්තිය යටතේ පිහිටුවන ලද කම්කරුවන්ගේ සුභසාධක අරමුදලට,

කාර්යාංශය විසින් ගෙවිය යුතු අතර, ඉතිරි මුදල කාර්යාංශය වෙත තබා ගනු ලැබිය යුතු ය.".

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තියේ (1) වන උපවගන්තියේ යෙදෙන "සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික සහ සාමාජිකයන් විසින් තමන් අතුරින් තත් කාර්ය සඳහා තෝරා පත් කර ගනු ලැබූ වෙනත් සාමාජිකයන් තිදෙනකුගෙන්" යන වචන වෙනුවට "සභාපති, උප සභාපති, ලේකම්, සහකාර ලේකම් සහ භාණ්ඩාගාරික සහ සාමාජිකයන් විසින් තමන් අතුරින් තත් කාර්ය සඳහා තෝරා පත් කර ගනු ලැබූ වෙනත් සාමාජිකයන් හතර දෙනකුගෙන්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 60අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියේ 60අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"කාර්යාංශය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු බව.

60අ. අල්ලස් පනතේ අර්ථානුකූලව හා එහි කාර්යය සඳහා කාර්යාංශය උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව අර්ථ නිරූපණය කරනු ලැබිය යුතුය.".

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වගන්තියේ (2) වන උපවගන්තියේ යෙදෙන "රුපියල් දස දහසකට නොඅඩු සහ රුපියල් පහළොස් දහස නොඉක්මවන දඩයකට ද වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද නොකඩව සිදු කරනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් සියයක අතිරේක දඩයකට ද ඔහු යටත් විය යුතු ය." යන වචන වෙනුවට "රුපියල් විසි දහසකට නොඅඩු සහ රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට ද, වරදකරු කරනු ලැබීමෙන් පසුව ඒ වරද නොකඩව කරනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් එක් දහසක අතිරේක දඩයකට ද, ඔහු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තියේ (අ) ඡේදයේ යෙදෙන "35 වන වගන්තියේ හෝ 36 වන වගන්තියේ හෝ 40(1) වන වගන්තියේ හෝ 41 වන වගන්තියේ හෝ 53 වන වගන්තියේ විධිවිධාන ;" යන වචන සහ ඉලක්කම් වෙනුවට "35 වන වගන්තියේ හෝ 36 වන වගන්තියේ හෝ 37 වන වගන්තියේ හෝ 40(1) වන වගන්තියේ හෝ 40(2) වන වගන්තියේ හෝ 41 වන වගන්තියේ හෝ 53 වන වගන්තියේ විධිවිධාන ;" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 67අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 67අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

" සාමාන්‍ය දණ්ඩන.

67අ. (1) මේ පනතේ යම් විධිවිධානයක් හෝ එය යටතේ සාදන ලද හෝ දෙන ලද යම් නියෝගයක්, විධානයක් හෝ නියම කිරීමක් කඩ කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) මේ පනතේ වෙනත් යම් විධිවිධානයක් මගින් කිසිම දඬුවමක් ප්‍රකාශිතව ම නියම කර නොමැති මේ පනත යටතේ වූ යම් වරදකට වරදකරු වන යම් තැනැත්තකු, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොඅඩු හා අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) "විදේශ සේවා නියුක්ති නියෝජ්‍යායතනයක ව්‍යාපාරය" යන්නෙහි අර්ථ කථනයේ "තැනැත්තන්ට ශ්‍රී ලංකාවෙන් පිටත සේවායෝජකයන් වෙත සේවා නියුක්තිය ලබා දීමේ" යන වචන වෙනුවට "තැනැත්තන්ට ශ්‍රී ලංකාවෙන් පිටත සේවායෝජකයන් වෙත (ආධුනිකත්වය හා පුහුණුව ඇතුළුව) සේවා නියුක්තිය ලබා දීමේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) "පෞද්ගලික අංශයේ ව්‍යවසාය" යන්නෙහි අර්ථ කථනයේ "ස්වයං සේවා නියුක්ත තැනැත්තකු විසින් කරගෙන යනු ලබන" යන වචන වෙනුවට "පුද්ගලයකු විසින් කර ගෙන යනු ලබන" යන වචන ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**11.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 255, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.